# ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව

# රත්නපුර දිස්ත්‍රික්කය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 පෙබරවාරි 28 දින ද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 පෙබරවාරි 13 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 අගෝස්තු 28 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිළි කිරීම් අනුව, ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම් හැර 2012 දෙසැම්බර් 31 දිනට ඉඹුල්පේ ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙයෙහුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතයෙ වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) සමාලෝචිත වර්ෂයේ ආරම්භක මුද්දර ගාස්තු ණයගැති ශේෂය රු. 2,984,878 ක්වූ අතර, ඉකුත් වර්ෂ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ලැබීම් රු. 7,206,925 ක් විය. ඒ අනුව ණයගැති ශේෂයට වඩා ලැබීම් රු. 4,222,047 ක් සමුච්චිත අරමුදලට බැර කල යුතු වුවද එසේ නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයේ මුද්දර ගාස්තු ණයගැති ශේෂය එම මුදලින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මිලදී ගත් රු. 168,554 ක ස්ථාවර වත්කම්, පුනරාවර්තන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) ගිණුම් විෂයයන් 04 කට අදාල මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනට ශේෂයන්ගේ එකතුව රු. 14,156,626 ක් වූ අතර, උපයෝගී ලේඛන අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු. 7,961,655 ක් විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්න වියදම ඉක්ම වූ ආදායම රු. 6,316,007 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 4,870,899 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i.) | වරිපනම් හා බදු | 160 | 104 | 102 |
| (ii.) | බදු කුලී | 76 | 80 | - |
| (iii.) | බලපත්‍ර ගාස්තු | 375 | 435 | - |
| (iv.) | වෙනත් ආදායම් | 12,473 | 10,019 | 6,543 |

#### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i.) | උසාවි දඩ | 170,249 |
| (ii.) | මුද්දර ගාස්තු | 5,271,720 |

2.3 අවිධිමත් ගනුදෙනු

තොෂිබා ඡායා පිටපත් යන්ත්‍රයට අමතර කොටස් ලබා ගැනීම සහ අළුත්වැඩියා කිරීමට අදාලව ඉදිරිපත් කල අංක 05003P හා 2011 ඔක්තෝබර් 10 දිනැති ඉන්වොයිසිය පළාත් අධ්‍යක්ෂක, පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂක කාර්යාලය, ගැටන්ගම, රත්නපුර යන ලිපිනයට ඉදිරිපත් කල ඉන්වොයිසියක් වූ අතර, වෙනත් ආයතනයකට අදාල වූ ඉන්වොයිස් පතකට ප්‍රාදේශීය සභාව මඟින් ගෙවීම් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව විගණනයේදී සෑහීමකට පත්විය නොහැකි විය. එසේම අංක 416 හා 2012 ජූනි 26 දිනැති ඉන්වොයිසිය, ඡායා පිටපතක අතින් ලියන ලද ඉන්වොයිසියක් වූ අතර, එයට අදාල චෙක්පත, ඉන්වොයිසියේ සඳහන් ඩී.එස්.කේ. ග්‍රැෆික් නමට නොලියා එස්.එන්. රත්නායක නමට ලියා තිබුණි.

2.4 කොන්ත්‍රාත් පරිපාලනය

අමුපිටිය කීනගහඇල්ල මාර්ගයේ අවශ්‍ය ස්ථාන කොන්ක්‍රීට් කිරීමේ කර්මාන්තය සඳහා එක ගමකට එක වැඩක් - 2012 සංවර්ධන වැඩ සටහන යටතේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් රු. 1,000,000 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. මෙම කර්මාන්තයේ ඉදිකිරීම් කටයුතු සඳහා ඉඹුල්පේ අමුපිටිය ප්‍රගති ගොවි සංවිධානය සමඟ රු. 980,000 ක වටිනාකමින් යුත් ගිවිසුමකට 2012 අගෝස්තු 07 දින එළඹ තිබුණි. ඇස්තමේන්තුවේ විෂයය අංක 03 ප්‍රකාරව අනුමත පස් සැපයීම ඝන මීටර් 36.80 ක් සඳහා රු. 25,480 ක්ද, එම පස් අතුරා තැලීම සඳහා විෂයය අංක 08 යටතේ රු. 10,668 ක්ද වශයෙන් එකතුව රු. 36,148 ක් ගෙවා තිබූ නමුත් එම වැඩ විෂයයන් ඉටු කර නොතිබූ බව 2013 අප්‍රේල් 04 දින කරන ලද භෞතික පරීක්ෂණයේදී අනාවරණය විය.

2.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව සතු ජල යෝජනා ක්‍රම 10 ක් තුලින් ජල යෝජනා ක්‍රම 06 ක් අලාභ ලබමින් පවත්වා ගෙන යන බවත්, ජල යෝජනා ක්‍රම වල 2012 වර්ෂයේ සමස්ථ ආදායම් සහ වියදම් සැලකීමේදී එහි අලාභය රු. 372,940 ක් බවත් නිරීක්ෂණය විය. අළුත් නුවර ජල යෝජනා ක්‍රමයට ලබා ගත් ණය මුදලින් සමාලෝචිත වර්ෂයේදී වාරික සහ පොලිය ලෙස රු. 629,497 ක් ගෙවා තිබුණි. එසේම ජල යෝජනා ක්‍රම නඩත්තුව සඳහා රු. 679,456 ක් වැය කර තිබුණි. ඒ අනුව ජල යෝජනා ක්‍රම නිසා සභා අරමුදලට වූ සමස්ථ පාඩුව රු. 1,681,893 කි. එසේම 2012 දෙසැම්බර් 31 දිනට හිඟ ජල ගාස්තුව රු. 1,352,111 ක්ද, හිඟ ජල සැපයුම් ගාස්තුව රු. 546,750 ක්ද විය.

(ආ) වැය විෂයයන් 18 කට අදාල ඇස්තමේන්තුගත ප්‍රතිපාදය වූ රු. 909,500 ක් උපයෝජනය කිරීමට සමාලෝචිත වර්ෂයේ කටයුතු කර නොතිබුණි.

3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) අයවැය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) වාහන උපයෝජනය

(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය